# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

## සමාගම් (සංශෝධන)

**2007 අංක 7 දරන සමාගම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා විසින්
2014 මාර්තු මස 21 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2014 මාර්තු මස 10 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

**[298 වන පනත් කෙටුම්පත]**


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 6.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

2—PL 008079—525 (2014/03)

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් 2007 අංක 7 දරන සමාගම් පනතේ 132 වන වගන්තිය ප්‍රතියෝජනය කරනු ලබන අතර එම ප්‍රතියෝජනය කරන ලද වගන්තියේ නීතියේ බලපෑම වනුයේ යම් පෞද්ගලික සමාගමක වාර්ෂික වාර්තාව සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත භාරදෙනු ලබන අවස්ථාවේ දී එම සමාගම විසින් අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය පුළුල් කිරීම සහ වාර්ෂික වාර්තාව භාර දෙන අවස්ථාවේ දී හෝ යම් සමාගමක් ගණන් බේරා වසා දැමීම ක්‍රියාත්මක වීමට පෙර හෝ පනතේ නිශ්චිතව දක්වා ඇති ආකාරයට සමාගමේ තත්ත්වය වෙනස්වීම හෝ සමාන අවස්ථාවක් ඇතිවන අවස්ථාවේ දී, එම ගණන් බේරා වසා දැමීම හෝ යම් වෙනසක් ඇත්නම් එම වෙනස සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත දැනුම්දීම වේ.

***3 වන වගන්තිය*** : පිළිවෙලින් ආදායම් බදු සහ එකතු කළ අගය මත බදුවලට අදාළව ඇවරකරු වෙත ඉදිරිපත් කළ යුතු ණයවලට අදාළ හිමිකම් සඳහා තෝරා ගැනීමේ කාල සීමාව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් දීර්ඝ කිරීමේ අරමුණින් නව වන උපලේඛනයේ 2 (ආ) සහ 2(ඇ) අයිතම, මෙම වගන්තිය මගින් සංශෝධනය කරනු ලැබේ.

***4 වන වගන්තිය*** : මෙම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා යන යෙදුම සඳහා අර්ථ නිරූපණයක් හඳුන්වා දීම වේ.

එල්. ඩී.—ඕ. 11/2014.

**2007 අංක 7 දරන සමාගම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2014 අංක දරන සමාගම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2007 අංක 7 දරන සමාගම් පනතේ 132 වන වගන්තිය සංශෝධනය කිරීම.

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2007 අංක 7 දරන සමාගම් පනතේ 132 වන වගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"පෞද්ගලික සමාගමක් විසින් වාර්ෂික වාර්තාවක් සමග ප්‍රකාශය සහ සහතික යැවිය යුතු බව.

132. (1) සෑම පෞද්ගලික සමාගමක් විසින්ම, එහි වාර්ෂික වාර්තාව සමග—

(අ) සමාගමේ අධ්‍යක්ෂවරුන් විසින් තමන්ගේ දැනුම හා උපරිම විශ්වාසය අනුව ප්‍රධාන ප්‍රඥප්තියේ නියමයන්ට අනුකූලව ක්‍රියාකර ඇති බවට එම අධ්‍යක්ෂවරුන් විසින් අත්සන් කරන ලද ප්‍රකාශයක්;

(ආ) (i) අවස්ථාවෝචිත පරිදි සමාගම විසින් අවසාන වාර්ෂික වාර්තාවෙන් පසුව හෝ එම වාර්තාව පළමු වාර්තාවක් සම්බන්ධයෙන් වන විට සමාගම සංස්ථාගත කරනු ලැබූ දිනයේ සිට සමාගමේ කොටස් හෝ ඍණ පත්‍ර කිසිවකට සහභාගිවන ලෙස මහජනයා වෙත යම් ඇරයුමක් නිකුත් කරනු නොලැබූ බව ස්ථිර කරමින්;

(ii) සමාගමේ කොටස් හිමියන්ගේ සංඛ්‍යාව පනහකට වැඩි බව වාර්ෂික වාර්තාවෙන් හෙළිවන අවස්ථාවක, එම අතිරික්තය,

2—PL 008028—475 (2014/03)

සම්පූර්ණයෙන්ම 27 වන වගන්තිය යටතේ පනවන ලද එකී සීමාව හා සම්බන්ධයෙන් එම වගන්තිය යටතේ ඇතුළත් නොවිය යුතු තැනැත්තන්ගෙන් සමන්විතව ඇති බවට,

අධ්‍යක්ෂවරයකු සහ සමාගමේ ලේකම්වරයා විසින් අත්සන් කරන ලද සහතිකයක්; සහ

(ඇ) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 106 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති නියමයන් සමාගම විසින් සපුරාලනු ලැබ ඇති බව ස්ථිර කරමින් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද සහතිකයක්;

රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) (අ) 131 වන වගන්තියට යටත්ව සෑම පෞද්ගලික සමාගමක් විසින්ම, එකී සමාගමේ වාර්ෂික වාර්තාව සමග හෝ එම සමාගම ගණන් බේරා වසා දැමීමට පෙර කවර හෝ අවස්ථාවක, නැතහොත් තත්වය වෙනස්වීමට පෙර හෝ මේ පනතේ නිශ්චිතව දක්වා ඇති සමාන අවස්ථාවක දී ගණන් බේරා වසා දැමීමක් හෝ වෙනසක් සිදු වන්නේ නම් එකී ගණන් බේරා වසා දැමීම හෝ වෙනස පිළිබඳ එකී සමාගම විසින් නියමිත ආකාරයට රෙජිස්ට්‍රාර්වරයා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය;

(ආ) එම දැන්වීමේ පිටපතක් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කිරීම රෙජිස්ට්‍රාර්වරයාගේ කාර්ය භාරය වන්නේ ය.".

මේ වගන්තියේ කාර්ය සඳහා—

"සමාන අවස්ථාවක්" යන්නෙන් පනතේ නිශ්චිතව දක්වා ඇති පරිදි යම් වැඩපිළිවෙලක්, ඒකාබද්ධ කිරීමක්, එක් කිරීම හෝ සමථයකට එළඹීම අදහස් වේ.

*ප්‍රධාන ප්‍රඥප්තියේ නව වන උපලේඛනය සංශෝධනය කිරීම.*

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ නව වන උපලේඛනයේ 2 අයිතමය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) (අ) ඡේදයේ "පූර්ණ අවුරුද්දක් සඳහා අයකරනු ලැබූ හෝ අයකරනු ලැබිය හැකි ආදායම් බද්ද එම අවුරුද්ද" යන වචන වෙනුවට "පූර්ණ අවුරුදු පහක් සඳහා අයකරනු ලැබූ හෝ අයකරනු ලැබිය හැකි ආදායම් බද්ද එම අවුරුදු පහ" යන වචන ආදේශ කිරීමෙන්;

(2) (ඈ) ඡේදයෙහි එම ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කිරීමෙන්:—

"(ඈ) ඈවර කිරීම ආරම්භ කිරීමට පෙරාතුව ම වූ අවුරුදු පහක කාල සීමාව ඇතුළත බදු අයකළ හැකි කාල සීමා සඳහා අයකරනු ලැබූ හෝ අයකරනු ලැබිය හැකි වූ එකතු කළ අගය මත බදු, එම බදු අයකළ හැකි කාල සීමා දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ විධිවිධාන අනුව තෝරාගනු ලැබිය යුතු ය.".

*ප්‍රධාන ප්‍රඥප්තියේ 529 වන වගන්තිය සංශෝධනය කිරීම.*

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 529 වන වගන්තියේ "පන්තිය" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

"දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා" යන්නෙන් යෙදුමට 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 208 වන වගන්තිය යටතේ පත්කරන ලද දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා අදහස් වන්නේ ය.

*අනනුකූලතාවක් ඇතිවූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.*

**5.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.